**ශීර්ෂය17- පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 30 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 22 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් **20**20 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්  ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී  වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන්  වැනි හේතු නිසා වන බැවිනි.

- කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ  ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු  ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි .

(අ) 1.6.2 ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.6.1 **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවන් පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සංඛ්‍යා භාණ්ඩාගාර පොත්වල සංඛ්‍යා සමඟ එකඟ වියයුතු වුවත්, භාණ්ඩාගාර පොත්වල ඇතුළත් රු. 2,059,514 ක අත්තිකාරම් ලැබීම්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,928,299 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.131,215 ක වෙනසක් විය. | මාර්ගෝපදේශ 3.1 හි උපදෙස් පරිදි අත්තිකාරම් ගිණුම භාණ්ඩාගාර පොත්වල සඳහන් ශේෂයට සැසඳීම් කර ඇති බව හා තවද මාර්ගෝපදේශයේ 3.6 ඡේදය ප්‍රකාරව ඒසීඒ 5 ආකෘතියෙහි නිවැරදි සංඛ්‍යා ඇතුලත් කර ඇති බව. | අදාල මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.**6.2 **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

------------------------

**දේපල පිරියත හා උපකරණ**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව විගණනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට සහතික කළ යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අගය හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2020 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ අගය අතර රු.9,100,100 ක වෙනසක් පැවතුණි. | සියළුම මගහැරීම් සහ වැරදි සටහන් නිවැරදි කර සැසඳීම් කර ඇති බව හා මෙය භාණ්ඩාගාරයේ මෘදුකාංග පද්ධතියේ ඇතිවූ දෝෂ සහිත සටහන් නිවැරදි කිරීමට සිදුකළ ක්‍රියාවලියක් මිස ආයතනය තුල වූ දෝෂයක් නොවන බව. | විගණනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප විය යුතුය. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වූ රු.186,610 ක තැන්පතු ලැබීම් හා ගෙවීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස ඇතුලත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන ලද බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | 2021 ජනවාරි 01 සිට ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර ගනු ලබයි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවත්, ඊට පටහැනිව පැමිණීමේ දීමනා හා ඉතිරි නිවාඩු දීමනා ගෙවා තිබුණි. | පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවල රාජකාරී සඳහා අනිවාර්යයෙන්ම කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර ප.ව. 6.30 පසුවී රැස්වීම් පැවැත්වෙන අවස්ථාවලදී එම දීමනාව ගෙවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනයන්හි ඇස්තමේන්තුගත පිරිවැය, අයවැය ඇස්තමේන්තු අගයයන්ට සමාන විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව ශෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම් වියදම රු.1,250,000 ක් වුවද වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට අනුව එම වියදම රු.1,500,000 ක් විය. | 2020 වර්ෂයේ පළමු කාර්තුවට අදාලව ස්ථාවර වත්කම් මිලදී ගැනීමට මෙම කාර්යාලය වෙත ප්‍රතිපාදන ලැබී නොතිබුනි. කෙසේ වුවද චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලදි. මෙම කාර්යය විධිමත්ව ඉටුකිරීමෙන් පසුව කාර්යාල උපකරණ කොටසක් මිලදී ගැනීම අත්‍යාවශ්‍ය වූ හෙයින් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් 2020 ජූනි මාසයේ සකස් කිරීමටත් එම සැලැස්ම ප්‍රකාරව භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට 2020.06.19 දින ලිපියක් අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. නමුත් විගණනයට ඉදිරිපත් කිරීමේදී ප්‍රමාද දොෂයකින් 2020 ජනවාරි ප්‍රසම්පාදන සැලැස්ම පමණක් ඉදිරිපත් කොට තිබූ අතර සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම යොමු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |